“නියත වශයෙන්ම හිරු හා සඳු අල්ලාහ්ගේ සංඥා අතුරින් වූ සංඥා දෙකකි. ඒ දෙකින් අල්ලාහ් ඔහුගේ ගැත්තන් බිය ගන්වයි. ජනයා අතුරින් කිසිවකුගේ මරණය වෙනුවෙන් හෝ ඔහුගේ ජීවිතය වෙනුවෙන් හෝ ඒ දෙක ග්රහණයට ලක් නොවෙයි. ඉන් යමක් නුඹලා දුටුවෙහු නම් එය නුඹලාගෙන් ඉවත් වන තුරු නුඹලා සලාතය ඉටු කොට අල්ලාහ්ගෙන් ප්රාර්ථනා කරනු.”

අබූ මස්ඌද් උක්බත් ඉබ්නු අම්ර් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී.
එතුමා අන්සාරි සාහාබිවරයකු මෙන්ම බද්ර් සහාබිවරයෙකි. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි.“නියත වශයෙන්ම හිරු හා සඳු අල්ලාහ්ගේ සංඥා අතුරින් වූ සංඥා දෙකකි. ඒ දෙකින් අල්ලාහ් ඔහුගේ ගැත්තන් බිය ගන්වයි. ජනයා අතුරින් කිසිවකුගේ මරණය වෙනුවෙන් හෝ ඔහුගේ ජීවිතය වෙනුවෙන් හෝ ඒ දෙක ග්රහණයට ලක් නොවෙයි. ඉන් යමක් නුඹලා දුටුවෙහු
නම් එය නුඹලාගෙන් ඉවත් වන තුරු නුඹලා සලාතය ඉටු කොට අල්ලාහ්ගෙන් ප්රාර්ථනා කරනු.” [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

සැබැවින්ම හිරු හා සඳු අල්ලාහ්ගේ ශක්තිය හා ඔහුගේ ප්රඥාව පෙන්වා දෙන සංඥා අතුරිනි. එහි ස්වභාවයේ වෙනස්වීම අඥාන යුගයේ ජනයා විශ්වාස කරමින් සිටියාක් මෙන් ප්රධානීන්ගේ ප්රාණය වෙනුවෙන් හෝ ඔවුන්ගේ මරණය වෙනුවෙන් හෝ සිදුවන්නක් නොවේ. මහපොළොවේ සිදුවීම් ඒවායෙහි බලපෑම් ඇති නොකරයි. සැබැවින්ම එසේ යම් වෙනසක් සිදුවනුයේ ගැත්තන් හට ඔවුන්ගේ පාපය ගැනත් ඔවුන්ට අත්වන දඬුවම් ගැනත් බිය ගන්වනු පිණිසය. එවිට ඔවුන් පාපක්ෂමාව අයැද අල්ලාහ් වෙත නැඹුරු වී අලුත් මිනිසෙකු වන්නේය. එහෙයින් එවන් අවස්ථාවන්හි එය පැහැදිලි වන තෙක් සලාතය වෙත හා ප්රාර්ථනාව වෙත යොමු වන්නයි සල්ලල්ලාහු අලය්හි වසල්ලම් මඟ පෙන්වා ඇත. ලොවෙහි ඇති සියලු රහස් හා සැළසුම් අල්ලාහ් සතුය.

https://sunnah.global/hadeeth/si/show/3101